www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මිලිටරිය නැගෙනහිර මූලෝපායික නගරයක් එල්ටීටීඊයෙන් තම ග්‍රහනයනට ගනී

**Sri Lankan military captures strategic eastern town from LTTE**

**සරත් කුමාර විසිනි**
**2007 ජනවාරි 25**

මාස ගනනක් පුරා ප්‍රහාර දියත් කිරීමෙන් පසුව දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) සැලකිය යුතු පරාජයක් අත් කර දෙමින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා පසු ගිය සිකුරාදා නැගෙනහිර වෙරලේ කේන්ද්‍රීය වාකරේ නගරය අල්ලා ගත්හ. පසු ගිය ජූලි මාසයේ සිට මේ දක්වා රජයේ හමුදාවන් අතට පත්වුනු එල්ටීටීඊ බල කොටු ගනනාවකින් නවතම බලකොටුව වාකරේ වේ.

එතරම් විරෝධයකින් තොරව හමුදාව නගරයට ඇතුලු විය. උතුරු හා දකුනු යන දෙපසින් සිටි රජයේ හමුදා අතට අසුවීමේ හැකියාවට මුහුන දුන් එල්ටීටීඊ ය පසු බැස්සේය. ඉරිදා වනවිට ආරක්ෂක හමුදා තම පාලනය යාබද වෙරුගල් හා කදිරවේලු ප්‍රදේශ කරා විහිදුවා තිබුනි. තම සටන්කරුවන් ඔවුන්ගේ ස්ථාන "යලි ගලපා ගත්" බව ප්‍රකාශ කරමින් එල්ටීටීඊ ප්‍රකාශකයෙක් පරාජය පිලිගත්තේය.

සටන් විසිරී තිබුනු බව පෙනෙන්නට තිබේ. ප්‍රදේශයෙන් පලායමින් සිටි එල්ටීටීඊ සටන්කරුවන් 18 දෙනෙකු ඝාතන කෙරුනු බව මිලිටරිය ඉරිදා ප්‍රකාශ කලේය. කජුවත්ත මිලිටරි කඳවුරට එල්ල කෙරුනු එල්ටීටීඊ ප්‍රහාරයකින් සොල්දාදුවන් හතර දෙනෙකු ඝාතනය වූ අතර වවුනතිවු හි හටගත් ගැටුමකදී තවත් සොල්දාදුවන් දෙදෙනෙක් මැරුනි. ආරක්ෂක අමාත්‍යංශය සඳහන් කරන ආකාරයට ඔක්තෝබරයේ පටන් රජයේ හමුදාවන්ට සොල්දාදුවන් 35 ක් අහිමි වී එල්ටීටීඊ සටන්කරුවන් 331 මරා දමා ඇත.

වාකරේ අල්ලා ගැනීම සඳහා ගෙන ගිය දිග් ගැස්සුනු මිලිටරි ප්‍රහාරය තමන් 2002 සටන් විරාම ගිවිසුමට තවදුරටත් බැඳී සිටින බවට ආන්ඩුව කරන ප්‍රකාශ ව්‍යාජයක් බවට පත් කරයි. හමුදාව නිරත වී සිටින්නේ හුදු "ආරක්ෂක" ක්‍රියාවල පමනක් යයි ජනාධිපති මහින්ද රාජපක්ෂ යලි යලිත් කියා ඇත. එසේ වුවත් ජූලි මාසයේ පටන් නැගෙනහිර මාවිල්ආරු, සාම්පූර් හා දැන් වාකරේ ද අල්ලා ගැනීමට මිලිටරිය ක්‍රියා කර ඇත. මේ මාසය මුල දී ව්‍යාජෝක්තිය පසෙකට දැමූ යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා තම අරමුන එල්ටීටීඊය නැගෙනහිරින් පලවා හැර ඊ ලඟට උතුරේ පාලනය අල්ලා ගැනීමට ප්‍රහාර දියත් කිරීම බව විවෘතව ම ප්‍රකාශ කලේය.

වසර 11කට පෙර වාකරේ අල්ලාගත් එල්ටීටීඊය එය සටන්කරුවන් හා උතුරුදිග මාවිල්ආරු කඳවුරෙන් එන සම්පාදනයන් ගොඩබස්සවන ස්ථානයක් ලෙස භාවිතා කොට ඇත. ත්‍රිකුනාමල වරාය හා මඩකලපුව අතර දකුනට දිවෙන ප්‍රධාන මාර්ගය ඔස්සේ වාකරේ පිහිටා ඇත. එය අහිමි වීමේ ප්‍රතිඵලය ලෙස නැගෙනහිර එල්ටීටීඊ හමුදා කොටස් දෙකට බෙදා ඔවුන්ව මිලිටරියේ අඛන්ඩ ප්‍රහාරයන්වලට ලක් වීමේ අවදානමට හෙලනු ඇත.

"ආරක්ෂාව පතා" ක්‍රියා කරනු වෙනුවට ශ්‍රී ලංකා හමුදාව අනුගමනය කරන්නේ 2002 දී මූලෝපායික ශේෂපත්‍රයක් සකස් කිරීමට එක්සත් ජනපද පැසිෆික් බලකායෙන් (පීඒසීඕඑම්) කන්ඩායමක් එවූ එක්සත් ජනපද මිලිටරියේ උපදේශයයි. ශ්‍රී ලංකා නාවික හමුදාවට වඩාත් වැදගත් වන කඳවුර ත්‍රිකුනාමලයේ වරාය බවට "ප්‍රශ්නයකින් තොරව" විස්තර කල පීඒසීඕඑම්, වරායෙන් දකුනට වන්නට පිහිටි සාම්පූර් ප්‍රදේශයේ තිබෙන එල්ටීටීඊ කඳවුරුවලට එය ගොදුරුවන්නට ඇති ඉඩකඩ පෙන්වා දුන්නේ ය. ප්‍රදේශය සුරක්ෂිත කරගන්නා ලෙස එය විවෘතව ම හමුදාවට උපදෙස් දුන්නේ ය.

පසු ගිය සති අන්තයේ තම තීරු ලිපියේ පීඒසීඕඑම් වාර්තාව උපුටා දැක්වූ සන්ඩේ ටයිම්ස් ආරක්ෂක වාර්තාකරු ඉක්බාල් අතාස් මෙසේ අදහස් දැක්වීය: " දැන් වාකරේ හා යාබද ප්‍රදේශ යලි අල්ලාගෙන තිබේ ය යන කාරනය ත්‍රිකුනාමල වරාය ආරක්ෂා කිරීමේ ගැඹුර සම්පාදනය කරයි. වඩාත් වැදගත් ලෙස යාබද කජුවත්ත හා මාන්කර්නිහි හට කන්ඩායම්වලට කාලතුවක්කු හා මෝටාර් වෙඩි ගරිල්ලන් විසින් එල්ල කරනු ලැබීමේ අවස්ථාව එමගින් වැලකේ. වාකරේ යලි තම ග්‍රහනයට ගත් හමුදාව ත්‍රිකුනාමලයේ සිට මඩකලපුව දිස්ත්‍රික්කය දක්වා දිවෙන සමීප ගොඩබිම් මාර්ගයක් ගරිල්ලන්ට අහිමි කරයි."

සාම ලැදි ජනයාගේ ජයග්‍රහනයක්" ලෙස උත්කර්ෂයට නැංවීය. "නිර්භීතභාවය සහ අධිෂ්ටානයෙන් යුක්ත ආරක්ෂක හමුදා නැගෙනහිර ප්‍රදේශයේ සියයට 95ක් ම එල්ටීටීඊ ග්‍රහනයෙන් මුදා ගැනීමට සමත් වී ඇතැ යි" ඔහු පුරසාරම් දෙඩී ය.

වාකරේ "මුදා ගැනීම" සිදුවූයේ දරුනු මානව වන්දියක් සමගිනි. ජාතික හා ජාත්‍යන්තර ආධාර කන්ඩායම් පැමිනීම වලක්වමින් ද ජනමාධ්‍යවේදීන්ට ඇතුල්වීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරමින් ද ප්‍රධාන ප්‍රවේශ මාර්ගවලට මුද්‍රා තැබීමට මිලිටරිය ක්‍රියා කලේ ය. 2002 සටන් විරාමය අධීක්ෂනය කිරීමේ වගකීම දරන ශ්‍රී ලංකා නිරීක්ෂන කමිටුවට පවා ප්‍රදේශයට පැමිනීම තහනම් කරනු ලැබීය. මූලික ආහාර ද්‍රව්‍ය සැපයීම - අවසාන පිටත් කර යැවීම සිදු වූයේ නොවැම්බර් 29 දාය - ආරක්ෂක හමුදා විසින් දැඩි ලෙස පාලනය කරන ලදි.

වටලෑම සමඟ එකපෙලට සීමාවකින් තොරව ගුවන් ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කරන ලද්දේ තුවාලකරුවන් විශාල සංඛ්‍යාවක් ඇති කරමිනි. ශ්‍රී ලංකා නිරීක්ෂන කමිටුවේ සහ අනෙකුත් නියෝජිත ආයතනවල ගනන් බැලීම්වලට අනුව අවම වසයෙන් සිවිල් වැසියන් 90 ක් ඝාතනය වී ඇත. කිහිප සියයකට තුවාල සිදු විය. ආන්ඩුව හා මිලිටරිය සරනාගත කඳවුරු ද ඇතුලත් සිවිල් වැසියන් සිටින ස්ථානවලට එල්ල කල ප්‍රහාර සාධාරනීකරනය කලේ එල්ටීටීඊය සිවිල් වැසියන්ව "මිනිස් පලිහ" ලෙස භාවිත කරන බව කියමිනි. ජනවාරි 17 දා වාකරේ රෝහලට එල්ල කල කාලතුවක්කු ප්‍රහාරයකින් 11 දෙනෙකුට තුවාල සිදු කල අතර හත් දෙනෙකුගේ තත්වය බරපතල විය.

තමන්ට හැකි සෑම ක්‍රමයකින්ම පසු ගිය සතියේ සිවිල් වැසියන් ප්‍රදේශයෙන් පලා ගියහ. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශිකා ඕර්ලා ක්ලින්ටන් සිද්ධිය විස්තර කලේ මෙසේය: "දහස් ගනන් ජනයා වැල නොකැඩී එති... ආහාර ඉතාමත් හිඟය. පැහැදිලිව ම දුර්වල මෙම ජනයා බියෙන් සිටිති. ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන බවට කරන සහතික වීමක් බලාපොරොත්තුවෙන් අපි සිටිමු." හමුදාව නගරය අල්ලා ගැනීමෙන් පසු සෙනසුරාදා දින තවත් 7000 ක් ජනයා ප්‍රදේශයෙන් පිටවූහ.

ප්‍රදේශයෙන් පිටවීමේ අවසරය බලාපොරොත්තුවෙන් දීර්ඝ ජනපෝලිම් හමුදා මාර්ගබාධකවල සිටියහ. එල්ටීටීඊ සාමාජිකයන් දඩයම් කිරීම සඳහා දැඩි ලෙස සන්නද්ධව සිටි සොල්දාදුවන් අහඹු ලෙස තරුන ජනයා කිහිප දෙනෙකු රඳවා ගත්හ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අනුව ගැටුම්වල නවතම වටය ඇරඹුනු තැන් පටන් සාම්පූර් හා වාකරේ අතර වෙරලබඩ තීරයේ ජනයා 60,000 ක් පමන අවතැන් කරනු ලැබ ඇත. සමස්තයක් ලෙස පසු ගිය අප්‍රේල් මාසයේ පටන් දිවයින පුරා ජනයා 205,000 ක් පමන අවතැන් කරනු ලැබ තිබේ.

වාකරේ අල්ලාගැනීම කොලඹ ස්වෝත්තමවාදී උද්දාමයන් තීව්‍ර කොට ඇත. යුද්ධය දැන් "තීරනාත්මක අවධියකට" ඇතුල් වී ඇති බව දක්ෂිනාංශික ද අයිලන්ඩ් පත්‍රය කියා සිටියේ ය. ලක්බිම දිනපතා පුවත්පත සාඩම්බරව පෙන්නුම් කලේ "වාකරේ රෝහල් භූමියේ දිදුලන සිංහ කොඩිය" යි.

ඇත්ත වසයෙන් ම "සාමය" පිලිබඳ තම සියලු කතා තිබියදී ම රාජපක්ෂ පැහැදිලි කොට ඇත්තේ මිලිටරි ප්‍රහාර නොකඩවා සිදුවනු ඇති බවයි. " තොප්පිගල හා කොක්කඩිචෝලේ ප්‍රදේශ එල්ටීටීඊයෙන් මුදා ගැනීම" පිලිබඳ තම සැලසුම් දල සටහනක් සෙනසුරාදා යුද හමුදාපති ෆොන්සේකා විසින් ඉදිරිපත් කරන ලදි. ඔහු උදාරම් ලෙස කියා සිටියේ ඔවුන්ව " හැකි ඉක්මනින් ම නැගෙනහිර පලාතෙන් එලවා දැමෙනු ඇති" බවයි.

"එදිරිවාදිකම් නවත්වා සාකච්ඡා මේසයට යලි පැමිනීමට තමන් සූදානම් යයි එල්ටීටීඊ ය හෙට ප්‍රකාශ කලහොත් අපි ද ක්ෂනිකව ප්‍රහාර නවත්වමු. ඔවුන් එසේ කරන්නේ නැතිනම් අපට සිදුවනු ඇත්තේ නැගෙනහිර දෙමල ජනයා විමුක්ත කර ගෙන සාකච්ඡා කැඳවීමටයි" යනුවෙන් ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල සඳුදා ප්‍රකාශ කලේය. ජූලි මාසයේ සිට මේ දක්වා සිදු වූ සෑම ප්‍රධාන ආක්‍රමනික ක්‍රියාවක් ම හමුදාව විසින් ආරම්භ කර ඇති තතු තුල මෙම ප්‍රකාශය එල්ටීටීඊයට අවස්ථාවක් දීමක් නොව ආන්ඩුවේ කොන්දේසි මත ඔවුන්ට යලි සාකච්ඡාවලට පැමිනෙන ලෙස නිකුත් කල අවසාන නිවේදනයකි.

කොළඹ පාලන කව තුල ඇති උද්යෝගී මනෝගතිය පහසුවෙන් දැනෙන සුලු ය. තම මෑත සාර්ථකත්වයන්ගෙන් දිරි ගැන්වී සිටින මිලිටරිය තමන්ට දශක දෙකකට වැඩි කාලයක් පුරා කිරීමට නො හැකි වූ දෙය වන එල්ටීටීඊය මිලිටරිමය වසයෙන් පරාජය කිරීම කාලය පිලිබඳ ගැටලුවක් පමනක් ලෙස හඟී. එක්සත් ජනපදයේ හා අනෙකුත් ප්‍රධාන බලයන්ගේ වක්‍ර පිටුබලය ලබන ආන්ඩුව දේශීයව හෝ ජාත්‍යන්තරව දේශපාලන විරුද්ධත්වයක් අවුලුවා නොගෙන තම සාහසික ආක්‍රමනකාරී යුද්ධය සමගින් ඉදිරියට යා හැකි යයි පැහැදිලිව ම ගනන් බලයි.

මිලිටරි කව සමග සමීප සබඳතා තිබෙන සන්ඩේ ටයිම්ස් වාර්තාකරු අතාස් පවා ප්‍රවේසම් ස්වරයක් රාවය කලේය. එල්ටීටීඊ භටයෝ බොහෝ කොට ම උපද්‍රව රහිතව පසුබැස ඇති බව දක්වමින් පසු ගිය සති අන්ත කොලමේ ඔහු "අධික ප්‍රමෝදයට හා ප්‍රීති ඝෝෂාවට" එරෙහිව අනතුරු ඇඟවීය. 1995 දී යාපන අර්ධද්වීපය යලි අල්ලා ගැනීම පිලිබඳ ආන්ඩුවේ ජයග්‍රාහී ප්‍රතික්‍රියාව මතකයට නැංවූ අතාස් යන්තම්

මාස හතකට පසු සන්නද්ධ හමුදාවන්ට ඔවුන්ගේ ඉතිහාසයේ දරුනුතම පරාජයක් අත්කරදෙමින් එල්ටීටීඊය මූලතිවු මිලිටරි කඳවුරට මූලික ප්‍රහාරයක් එල්ල කිරීමට අවධානය යොමු කලේ ය.

තවදුරටත් අතාස් පෙන්වා දුන්නේ 2004 දී එල්ටීටීඊයෙන් කැඩී ගිය නැගෙනහිර පදනම් වන සන්නද්ධ සටන්කාමී කන්ඩායමක් වන ඊනියා කරුනා කන්ඩායම මත මිලිටරිය රැඳී සිටින බවයි. එල්ටීටීඊයට එරෙහි යුද්ධයට දෙන සහයෝගයට හිලවු ලෙස වී. මුරලිදරන් හෙවත් කරුනාට ඔහුගේ සන්නද්ධ හමුදා ගොඩ නැගීමටත් තමිල් මක්කල් විඩුතලයි පුලිහාල් (ටීවීඑම්පී) නම් තම දේශපාලන අංශයේ බලපෑම පුලුල් කිරීමටත් අවසර දෙනු ලැබ ඇත. අතාස් සඳහන් කල ආකාරයට ආන්ඩුව "තවත් අද්භූත සත්වයෙකු නිර්මානය කරමින් දිරිදෙමින් සිටීය" යන්න පිලිබඳව මිලිටරි ධුරාවලියේ කොටස් "අතිශයින් ම සංවේදීය."

අතාස්ගේ අනතුරු ඇඟවීම් ආන්ඩුව එහි ප්‍රතිගාමී ගමන් මාවතින් පසුපසට ඇදීමට තුඩු දේ යන්න අතිශයින් ම අභ්‍යව්‍ය ය. 2005 වසරේ නොවැම්බර් මාසයේ යන්තමින් ධුරයට පත්වුනු තැන් පටන් රාජපක්ෂ වැඩ කරන ජනයා බෙදා වෙන් කිරීමේ ද දිවයිනේ ගැඹුරු වන ආර්ථික හා සමාජ අර්බුදය විසඳීමට ඔහුගේ අසමර්ථතාවෙන් මහජන අවධානය ඉවතට හැරවීමේ ද උපක්‍රමයක් ලෙස වාර්ගික සිවිල් යුද්ධය යලි දියත් කොට ඇත. යුද්ධයට හා ආන්ඩුවේ ආර්ථික පිලිවෙත්වලට එරෙහි විරුද්ධත්වය මැඩීම සඳහා ආන්ඩුව වඩවඩාත් විවෘත මර්දනයට යොමු වී ඇත. කෙසේ වුවත් එසේ කිරීම මගින් ඔහු, වැඩි කල් යාමට මත්තෙත් පිපිරී එන්නාවූ සමාජ හා දේශපාලන කැලඹීම්වලට පදනම දමමින් සිටියි.

© www.wsws.org